**තලාව ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**----------------------------------------**

#### 1.3.1 නොසැසඳු ගිණුම්

**-----------------**

හිඟහිටි වරිපනම්වල මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වටිනාකම සහ ඊට අදාළ උපලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.1,032,590 ක වෙනසක් දැක්වුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

එකතුව රු.69,415,340 ක් වු වත්කම් හා වගකීම් ගිණුම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් අයිතිය සනාථ කිරිමේ ලියවිලි/විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**02. මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය රු.9,424,473 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.9,495,523 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම් බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල නව දියුණු කල ප්‍රදේශ හදුනාගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.15,161,550 ක්වූ හිඟ ආදායම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් පිළියෙළ කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා.**

**(අ)** සමාලෝචිත වර්ෂයේ එකතු කල රු.29,100 ක්වූ එකතු කළ අගය මත බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** වසර 05 කට අධික කාලයක් පැරණි විෂයයන් 04 කට අයත් එකතුව රු.975,110 ක ලැබිය යුතු ගිණුම්ද,විෂයයන් 02 කට අයත් එකතුව රු.98,490 ක්වූ ගෙවිය යුතු ගිණුම්ද නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි.

**(ඇ)** 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය වත්කම්**

-------------------

සභාව සතුව රු.3,564,197 ක් වටිනා වාහන 04 ක් හා ගොඩනැගිල්ලක් වසර 04 කට වඩා වැඩි කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**04. පද්ධති හා පාලනය**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලනය ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය

**(ඇ)** වත්කම් කළමනාකරණය

**(ඈ)** ණය ගැති හා ණය හිමි පාලනය